# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා (නව/පැරණි නිර්දේශය)

සිනමා හා රූපවාහිනී රසාස්වාදය **IMAT – E 3025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. විචාරයක් යනු කුමක්දැයි හඳුන්වා දී චිත්‍රපට විචාරයක් සිදු කළ හැකි ක්‍රම පිළිබඳව විග්‍රහ කරන්න.

02. විචාරකයාගේ මඟ පෙන්වීමකින් තොරව නිර්මාණාත්මක කලාවක දියුණුවක් ඇති නොවේ. මෙම අදහස සිනමා කලාව ඇසුරෙන් පහදන්න.

03. මෑත කාලීනව රූපවාහිනී නාලිකාවල විකාශනය වූ සිංහල ටෙලිනාට්‍ය ඇසුරෙන් "නූතන ටෙලිනාට්‍යවල දැකිය හැකි විශේෂ සළකුණු" මැයෙන් පුවත්පතකට සුදුසු ලිපියක් ඉදිරිපත් කරන්න.

04. මෑතක දී ඔබ නැරඹූ චිත්‍රපටයක් පිළිබඳව සිනමාත්මක රසාස්වාදයක යෙදෙන්න.

05. ප්‍රේක්ෂකයා චිත්‍රපටයක් නැරඹීම සඳහා මෙන්ම චිත්‍රපටයක් ප්‍රතික්ෂේප කිරීමට බලපාන කරුණු මොනවාදැයි විමසන්න.

06. පහත දැක්වෙන විචාර සිද්ධාන්ත පිළිබඳව කෙටි සටහන් ලියන්න.

    i. මාක්ස්වාදී ප්‍රවේශය
    ii. ස්ත්‍රීවාදී ප්‍රවේශය
    iii. සංඥාර්ථවේද ප්‍රවේශය
    iv. ඓතිහාසික ප්‍රවේශය
    v. මනෝවිශ්ලේෂණාත්මක ප්‍රවේශය

07. සුදුසු වර්ගීකරණයක් යටතේ හඳුන්වා දෙමින්, නූතන රූපවාහිනී වැඩසටහන්හී ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන්න.

08. කලා මාධ්‍යයන්ගේ ඉහළම පරිණාමීය එළඹුම සිනමා කලාව බව පහදමින් විවරණයක යෙදෙන්න.

**********************************